# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,931 — 1970 නොවැම්බර් 5 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I. වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 811 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 814 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... | 815 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 815 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 819 |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 822 |
| ''සුරාබද්ධ ආඥාපනත'' පිළිබඳ දැන්වීම් ... ... | — |



සැළකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 356**

අංකය. ඩී. 183/ආර්ජීසී.

### යුද්ධ හමුදාව—ස්ථිර බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද තනතුරු අත් හැරීම් හා පත් කිරීම්

තනතුරු අත් හැරීම්

1970 ඔක්තෝබර් 15 දින සිට :

කර්නල් වීරසේන රාජපක්ෂ, එම්.බී.ඊ.—1 වන විමර්ශණ රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරී තනතුර අත් හැරීම.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සුගතපාල සිරිල් රණතුංග, ල.ස.ස.බ.—යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 තනතුර අත් හැරීම.

පත් කිරීම්

1970 ඔක්තෝබර් 15 දින සිට :

කර්නල් වීරසේන රාජපක්ෂ, එම්.බී.ඊ.—යුද්ධ හමුදා මූලස්ථානයේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික තනතුරට පත් කිරීම.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සුගතපාල සිරිල් රණතුංග, ල.ස.ස.බ. 1 වන විමර්ශණ රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරී තනතුරට පත් කිරීම.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 දින,
කොළඹ දී ය.

11—24

---

**1970 අංක 357**

අංකය : ඩී. 250/ආර්ජීසී/4.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් හා ජ්‍යෙෂ්ඨත්වය ප්‍රතිශෝධනය කිරීම

පහත නම සඳහන් නිලධාරියා 1965 නොවැම්බර් 1 වැනි දින සිට ලුතිනන් කර්නල් වශයෙන් :—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) මල්ලිය වඩු ගුණදාස ජෝර්ජ් රණතුංග, ලං. යු. පොදු. සේ. බ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කර ඇති දිනයන්හි සිට ලුතිනන් කර්නල්වරුන් වශයෙන්, විටින් විට සංශෝධනය කර ඇති 1949 ඔක්තෝබර් 10 වැනි දින හා අංක 10,028 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිලධාරීන්ගේ රෙගුලාසිවල 11(ඊ) රෙගුලාසිය අනුව, ලුතිනන් කර්නල් ආර්. ටී. තම්බයියා, ල. යු. වෛ. බ. ට පසු ආසන්තවම්, පහත සඳහන් ජ්‍යෙෂ්ඨ පිළිවෙල අනුව ලුතිනන් කර්නල් නිලයෙහි ඔවුන් ජ්‍යෙෂ්ඨත්වය ගන්නවා ඇත :—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ගාමිණී විළුන් සි ජයසිංහ, ල. යු. යු. බ. 1969 මැයි මස 18 වැනි දින,

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සිසිල් තියඩෝර් කල්දේරා, ල. ස. බ. 1964 ඔක්තෝබර 1 වැනි දින.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 24 දින,
කොළඹදී ය.

11—99

---

1970 අංක 358

අංකය ඩී.320/ආර්ඊසීටී/ඒ.

## යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්, පත්කිරීම් අත්හැර යාම් හා පත් කිරීම්

### උසස් කිරීම

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියේ දක්වා ඇති දිනයන්හි සිට තාවකාලික ලුතිනන් කර්නල් වශයෙන් :—

මේජර් ආනන්ද ආරච්චිගේ දෙන් බෙබී පෙරේරා, ල.යු.යු.බ.—1965 නොවැම්බර් මස 5 දින.

මේජර් දෙඩම්පෙ ගමගේ බූපානන්ද පෙරේරා, ල.සි.රෙ.—1968 මැයි මස 1 වැනි දින.

### පත්කිරීම් අත්හැරයාම්

**1970 ජූනි මස 8 වැනි දින සිට :**

මේජර් වල්ලිපුරම් රාමනාදන්, ල.කා.හ.—වැඩබලන සහකාර විධායක හා උපකරණ පාලක අධිකාරි (ලංකා ස්වෙච්ඡා බල සේනාව) තනතුර අත්හරින ලදී.

**1970 ජූලි මස 15 වැනි දින සිට :**

කර්නල් පර්සි ඩග්ලස් රාමනායක—නීති විරෝධිව පැමිණෙන්නවුන් මැඩලීමේ කාර්ය බලසේනාවේ ආඥපති තනතුර අත්හරින ලදී.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ලුවලින් හැරල්ඩ ඩග්ලස් ද සිල්වා, ල.සි.රෙ.—ලංකා ශිෂ්‍ය භට බලකායේ සේනා විධායක තනතුර අත් හරින ලදී.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) එදිරිමුනි ටෙනිසන් ද සොයිසා අබයසේකර, ල.පා.හ.—පනාගොඩ යුද හමුද බල සේනාවේ ආඥපති තනතුර අත්හරින ලදී.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ෆ්‍රෙඩරික් බර්න්ස් ද සිල්වා ශ්‍රී ආනන්ද, ගැ. හේ. බ.—දියතලාවේ යුද හමුද බලසේනාවේ ආඥපති තනතුර අත්හරින ලදී.

ලුතිනන් කර්නල් හෙක්ටර් තිලක් ගුණසේකර, ල.කා.හ.—4 වෙනි රෙජිමේන්තුව, ලංකා කාලතුවක්කු හමුදවේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

ලුතිනන් කර්නල් මිරිසිය ආචාරියගේ ජීවසෝම, ල.කා.හ.—ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ වැඩබලන අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

ලුතිනන් කර්නල් තුවන් සමයිරාන් බුහාරි සලී, ල.සි.රෙ.—1 වෙනි බල ඇණිය, ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සිසිල් තියඩෝර් කල්දේරා, ල.ස.බ.—ලංකා යුධ හමුද පුරෝගාමී බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) ක්ලින්ටන් චාර්ල්ස් ලැබ්‍රොයි, ල.සි.රෙ. ලංකා යුද හමුද පොදු සේවා බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ලෝරන්ස් ජස්ටින් ඉග්නේෂස් ප්‍රනාන්දු, ල.ස.බ.—1 වැනි රෙජිමේන්තුව, ලංකා සංඥ බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඇන්තනි පයස් රත්නරාජා ඩේවිඩ, ල.පා.හ.—1 වැනි බල ඇණිය, ලංකා පාබල හමුදවේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) තිස්ස ඉන්දකවීරතුංග, ගැ.හේ.බ. 1 වැනි ගැමුණු හේවා බල ඇණියේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල් ඩුලිප් ජස්ටින් ද සිල්වා වික්‍රමනායක, ල.කා.හ.—ලංකා යුද හමුද පොලිස් හේවා බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හරින ලදී.

### පත්කිරීම

**1970 ජූලි මස 15 වැනි දින සිට :**

කර්නල් පර්සි ඩග්ලස් රාමනායක—පනාගොඩ යුද හමුද බලසේනාවේ ආඥපති වශයෙන්.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) එදිරිමුනි ටෙනිසන් ද සොයිසා අබයසේකර, ල.පා.හ.—නීති විරෝධිව පැමිණෙන්නවුන් මැඩලීමේ කාර්ය බල සේනාවේ ආඥපති වශයෙන්.

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) ෆ්‍රෙඩරික් බර්නස් ද සිල්වා ශ්‍රී ආනන්ද, ගැ.හේ.බ.—ලංකා ශිෂ්‍ය භට බලකායේ හා ලංකා යුද හමුද පුරෝගාමී බලකායේ සේනා විධායක වශයෙන්.

ලුතිනන් කර්නල් හෙක්ටර් තිලක් ගුණසේකර, ල.කා.හ.—පනාගොඩ යුද හමුද බලසේනා මූලස්ථානයේ සහකාර විධායක හා උපකරණ පාලක අධිකාරි වශයෙන්.

ලුතිනන් කර්නල් තුවන් සමයිරාන් බුහාරි සලී, ල.සි.රෙ.—සහකාර විධායක හා උපකරණ පාලක අධිකාරි (ලංකා ස්වෙච්ඡා බලසේනාව) වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) මල්ලියවඩු ගුණදස ජෝර්ජ් රණතුංග, ල.යු.පොදු සේ.බ. —දියතලාවේ පාලන ප්‍රදේශයේ ආඥපති වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ආනන්ද ආරච්චිගේ දෙන් බෙබී පෙරේරා, ල.යු.යු.බ.—ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සිසිල් තියඩෝර් කල්දේරා, ල.ස.බ.—1 වැනි රෙජිමේන්තුව, ලංකා සංඥ බලකායේ අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) දෙඩම්පෙගමගේ බූපානන්ද පෙරේරා, ල.සි.රෙ.—1 වැනි බල ඇණිය, ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ක්ලින්ටන් චාර්ල්ස් ලැබ්‍රොයි, ල.සි.රෙ.—පනාගොඩ ආධාරක සේනා සමූහ මූලස්ථානයේ සහකාර විධායක හා උපකරණ පාලක අධිකාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) තිස්ස ඉන්ද්‍රක වීරතුංග, ගැ.හේ.බ. —ලංකා යුද හමුද පොදු සේවා බලකායේ අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඩුලිප් ජස්ටින් ද සිල්වා වික්‍රමනායක ලංකා.හ.—4 වැනි රෙජිමේන්තුව, ලංකා කාලතුවක්කු හමුදවේ අණදෙන නිලධාරි වශයෙන්.

මේජර්(තාවකාලික ලුතිනන් කර්නල්) සෝමවීර ඩෙනිස්ටර් නානායක්කාර වසන් හපුගල, ල.ස.ස.බ.—නීතිවිරෝධිව පැමිණෙන්නවුන් මැඩලීමේ යුද හමුද බලසේනාවේ (මන්නාරම) සම්බන්ධතා නිලධාරි වශයෙන්.

මේජර් සුමන බණ්ඩා මියනදෙනිය, ල. සි. රෙ.—1 වැනි ගැමුණු හේවා බල ඇණියේ වැඩ බලන අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් හෙන්රි විජය අතුකෝරාල, ල.පා.හ.—1 වැනි බල ඇණිය, ලංකා පාබල හමුදවේ වැඩබලන අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් කලහේ ආචාරී මෙස්රිගේ නන්ද සිල්වා, ල.පා.හ.—ලංකා යුද හමුද පොලිස් හේවා බලකායේ වැඩබලන අණදෙන නිලධාරි වශයෙන්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 25 වැනි දින,
කොළඹ දී ය.

11—97

**1970 අංක 359**

අංකය : ජී. 250/ආර්ජීසීපී/5.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්කිරීම අත්හැර යාම හා පත්කිරීමක්

**පත්කිරීම අත්හැරයාම**

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) බැස්ටියන් කෝරාලලාගේ වික්ටර් ජස්ටස් එතල්රඩ් රුද්රිගු, ලං. කා. හ., 1970 ජූලි මස 15 වැනි දින සිට නීති විරෝධිව ඇගමනය කරන්නන් මැඩලීමේ යුද්ධ හමුදා බලසේනාව, මන්නාරමේ ආඥපති තනතුර අත්හරින ලදී.

**පත්කිරීම**

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) බැස්ටියන් කෝරාලලාගේ වික්ටර් ජස්ටස් එතල්රඩ් රුද්රිගු, ලං. කා. හ., 1970 ජූලි මස 15 වැනි දින සිට නීති විරෝධිව පැමිණෙන්නවුන් මැඩලීමේ කාර්ය බලසේනාවේ (යාපනය) සම්බන්ධතා නිලධාරි වශයෙන්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 දින,
කොළඹදී ය.

11—107

---

**1970 අංක 360**

අංකය : ඩී.250/ආර්ජීසීපී/3(111)

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 ජූනි මස 1 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් සත්‍යයෙන්ද්‍ර ප්‍රසන්න ඉලංගන්තිලක, ලං. යු. පොලිස් හේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 24 දින,
කොළඹ දීය.

11—108

---

**1970 අංක 361**

අංකය. ඩී. 21/ආර්ජීසීපී/259.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා විශ්‍රාම ගැනීමක්

**උසස් කිරීම**

පහත නම සඳහන් නිලධාරියා, 1959 ඔක්තෝබර් මස 1 වැනි දින සිට කපිතාන් වශයෙන් :—

ලුතිනන් (තාවකාලික කපිතාන්) සිවසම්බු විග්නරාජා, ල.යු.යු.බ.

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා, 1969 සැප්තැම්බර් මස 1 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇත :—

කපිතාන් සිවසම්බු විග්නරාජා, ල.යු.යු.බ.

1969 සැප්තැම්බර් 26 දිනැති අංක 14,873 දරණ ගැසට් පත්‍රයේ මෙම නිලධාරියාගේ විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් පළවූ 1969 අංක 331 දරණ නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 24 දින,
කොළඹ දී ය.

11—53

---

**1970 අංක 362**

අංකය : ඩී. 264/ආර්ජීසීපී/බී.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියේ සඳහන් කර ඇති දිනයන්හි සිට කපිතාන්වරුන් වශයෙන් :—

ලුතිනන් (තාවකාලික කපිතාන්) ආර්තර් රන්ජිත් පෙරේරා විජේරත්න, ල. සි. රෙ., 1967 ජූනි 20 වැනි දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ඩොමී රණසිංහ, ල. ස. බ., 1969 පෙබරවාරි 21 වැනි දින.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 දින,
කොළඹ දී ය.

11—52

---

### නිවැරදි කිරීම

අංක 14,925 හා 25.9.70 දින දරණ ගැසට් පතේ 712 පිටුවේ අංක 313 දරණ දැන්වීමේ 5 වෙනි පෙල "මේජර් රණසිංහ බණ්ඩා වණිසේකර නාරන්පනාව, ඊඩී. ලශිබ" යනුවෙන් සංශෝධනය විය යුතුයි.

9—943

---

**1970 අංක 363**

අංකය : සීඑච්/වීඑජ්/34 (බී).

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස්කිරීමක් හා පත්කිරීමක්

**(අ) උසස් කිරීම**

1970 ජූලි මස 15 වැනි දින සිට ලුතිනන්-කර්නල් වශයෙන්—

මේජර් ස්ටැන්ලි ලෙනාඩ් වැගොඩපොල, ඊ. ඩී., ල.යු.පු.බ.

**(ආ) පත් කිරීම**

1970 ජූලි මස 15 වැනි දින සිට ලංකා යුද හමුදා පුරෝගාමී බලකායෙහි අණදෙන නිලධාරි වශයෙන්, ලුතිනන්-කර්නල් ස්ටැන්ලි ලෙනාඩ් වැගොඩපොල, ඊ.ඩී., ල.යු.පු.බ. පත්කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 දින,
කොළඹදීය.

11-21

---

**1970 අංක 364**

අංකය : සීඑච්/විඑජ්/9/ඒ.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් කිරි බණ්ඩාර විජේසිංහ, ල.යු.සේ.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 වැනි දින,
කොළඹ දී ය.

11—22

1970 අංක 365

අංකය : ඩී. 22/ආර්ඊසීඑන්/186

**රාජකීය ලංකා නාවික හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1970 නොවැම්බර් මස 29 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ්‍රාම ගනී :—

උපදේශක ලුතිනන් කොමාන්ඩර් එස්. නවරත්නරාජා. රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 23 දින,
කොළඹ දී ය.

11-23

---

1970 අංක 366

අංකය : සීජී. 252/ආර්ඊසීඑෆ්/4.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 නොවැම්බර් මස 1 වෙනි දින සිට විං කොමාන්ඩර් වශයෙන් :

ස්කොඩ්‍රන් ලීඩර් (තාවකාලික විං කොමාන්ඩර්) දොන් බන්දුල සනත් වීරත්න (01040) පාලන.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 24 දින,
කොළඹ දී ය.

11-142

---

1970 අංක 367

අංකය : සීජී. 3/ආර්ඊසීඑෆ්/69.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත නම සඳහන් බලපැංති සැරයන් 1970 ජූනි මස 6 දින සිට රාජකීය ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් වශයෙන් අධිකාරියට පත් කොට ඔහු පාලන/උපකරණ ශාඛාවට ඇතුලත් කිරීමට ප්‍රසාදය පළකර ඇත.

1136 බලපැංති සැරයන් තව්හිද් මොහමඩ් කලීඩ්—පාලන/උපකරණ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 24 දින,
කොළඹ දී ය.

11—143

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 368

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත :—

අංක ජේඑම්./ජී. 47/66.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත වැඩ බාරගන්නා තුරු, එල්. සමරතුංග මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 ඔක්තෝබර් මස 23 දින සිට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම් වශයෙන්.

අංක : ජේඒජී. 11/48.

ඩී. විමලරත්න මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 නොවැම්බර් 10 දින සිට, කොළඹ දි. උ. අංක 11704/එල්. දරණ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංක : ජේඒජී. 12/48.

ඒ. එච්. ඊ. මොලමුරේ මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 නොවැම්බර් මස 4 දින සිට, කොළඹ ම. උ. අංක 4474/යී දරණ නඩුවේ තීන්දුව දීම පිණිස, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : ජේඒජී. 7/48.

බී. ආර්. සිල්වා මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 ඔක්තෝබර් මස 28 දින සිට, බලපිටිය ම. උ. අංක 53903 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : ජේඒජී 21/48.

එෆ්. ජී. බී. ප්‍රනාන්දු මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 ඔක්තෝබර් මස 16 දින සිට, ගම්පොළ ම. උ. අංක 18046 දරණ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන සහ ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : ජේඑල්/එස්. 27/62.

කේ. වී. සර්වණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඊ. එම්. තාහිර් මහතා, 1970 ඔක්තෝබර් මස 15 දින සහ නොවැම්බර් මස 1 දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : ජේඑල්/ඩී. 21/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. කනගරත්නම් මහතා, 1970 ඔක්තෝබර් මස 30 දින සිට නොවැම්බර් මස 2 දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංක : ජේඑල්/පී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා, 1970 ඔක්තෝබර් මස 27 දින සිට නොවැම්බර් මස 1 දින දක්වා, ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ලමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංක : ජේඑල්/ඩබ්ලිව්. 10/63.

සී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මහවරාජා මහතා, 1970 ඔක්තෝබර් මස 27 දින සිට 30 දින දක්වා, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ලමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංක : ජේඑල්/සී. 6/69.

එම්. එස්. එස්. කොරයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒන්. ජේ. වී. කුරේ මහතා, 1970 ඔක්තෝබර් මස 28 සහ 31 දිනයන්හි, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. වී. සේනාධිරාජා මහතා, 1970 සැප්තැම්බර් මස 28 දින සිට 30 දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : පීඑල්/එන්. 2/57

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමම්පිල්ලේ මහතා, 1970 ඔක්තෝබර් මස 4 දින සිට 8 දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : පීඑල්/යූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ඒ. පී. රණවීර මහතා, 1970 ඔක්තෝබර් මස 5 දින, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිනිගොඩ, බෙලිගල් සහ පරනකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංක : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමම්පිල්ලේ මහතා, 1970 ඔක්තෝබර් මස 5 සහ 6 දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංක : පීඑල්/පී. 10/63.

ඩී. රී. එස්. රණසිංහ මහතා, 1970 නොවැම්බර් මස 1 දින සිට 5 දින දක්වා, 7 වැනි දින සිට 17 දින දක්වා, 14 දින සිට 20 දින දක්වා, 22 දින සිට 27 දින දක්වා, 29 සහ 30 දිනයන්හි හෝ නැවත නියමයක් කරන තුරු. හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

එල්. සමරතුංග,
අධිකරණ සේව කොමිෂන් සභාවේ
වැඩ බලන ලේකම්.

1970 ඔක්තෝබර් මස 28 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

11-144

---

# වෙනත් පත් කිරීම් ආදිය

### 1970 අංක 369

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කාසිනාදර් සිවපාලන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-50

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී. 18/46.

## සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥාපනත

### ආඥාව

(127 වැනි අධිකාරය වන) සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, 1970 ජූලි මස 24 වැනි දින අංක 14,916 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද, 1962 ජනවාරි 18 වැනි දින අංක 12,881 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ ආඥාව, ඊට යා කළ උපලේඛනයෙහි 1 වන තීරයේ අගට පහත දැක්වෙන, එනම් :—

"තිබ්බොටුවාවේ දොන් ජිනසේන විතාරණ"

යන්න ඇතුළත් කිරීමෙන් මේ ආඥාවෙන් සංශෝධනය කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1970.10.23 වෙනි දින,
කොළඹ දී ය.

11-31/1

ඇල්. ඩී.—බී. 18/46.

## සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥාපනත

### ආඥාව

(127 වැනි අධිකාරය වන) සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, 1970 සැප්තැම්බර් 11 වැනි දින අංක 14,923 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද, 1962 ජනවාරි 26 වැනි දින අංක 12,885 දරන ගැසට් පත්‍රයෙහි පළවූ ආඥාව, ඊට යා කළ උපලේඛනයෙහි 1 වන තීරයේ අගට, පහත දැක්වෙන, එනම්—

"ධර්මසේන මාමඩුව
දොන් ඩේවිඩ් අරංගල
ඉලංගන්පේලිගෙදර ජේම්ස් ඉලංගසේකර
චාර්ලිස් නෙවිල් උදලාගම
දොන් ලයනල් බීඩ් ජෝශප් අබේරත්න
ත්‍යාගරාජා ෂන්මුගරාජා
කොට්ටවත්තේ ආරච්චිලාගේ සිරිසේන විජේවර්ධන
සුගනපාල පිටිගල ලියනගේ
සෙනරත් බණ්ඩාර වැල්ලව"

යන්න ඇතුලත් කිරීමෙන් මේ ආඥාවෙන් සංශෝධනය කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1970.10.18 දින,
කොළඹ දී ය.

11-31/2

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් බර්ට්‍රම් සේනක බණ්ඩාර තිත්තවෙල මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-49

---

## ලංකා පොල් මණ්ඩලය

1935 අංක 13 දරණ පොල් නිෂ්පාදන ආඥාපනතේ 2 (1) වන වගන්තිය යටතේ ම වෙත පැවරී ඇති බලතල අනුව වැවිලි කර්මාන්ත ඇමති කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, පහත නම් සඳහන් අය 1970.9.5 දින සිට ලංකා පොල් මණ්ඩලයේ සාමාජිකයින් ලෙස මෙයින් පත් කරමි :—

1. එන්. සී. විතාරණ මහතා (සභාපති)
2. එච්. ජී. ජී. කරුණාරත්න මහතා
3. එම්. කේ. එම්. මුත්තෙටුවත්ත මහතා
4. ඒ. ජී. වාස් මහතා
5. ඒ. එස්. විජයානන්ද මහතා
6. මුදලි ජී. ජී. ද ඉසෙඩ්. සිරිවර්ධන මහතා
7. ඒ. එම්. එම්. කුමාරරත්න මහතා
8. කේ. සෙල්වනාදන් මහතා
9. ආචාර්ය ඩබ්ලිව්. ආර්. එන්. නැතැනියල් මහතා
10. දෙස්තර ජේ. සිවප්‍රගාසම් මහතා
11. ඒ. එල්. සින්නලෙබ්බේ මහතා
12. කේ. බී. දිසානායක මහතා (වාණිජ අධ්‍යක්ෂ)

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

11-36

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනි දායින් අවසන් වන කාලසීමාවට ජේ. පී. අමරපාල මහතා කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබුහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 26 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

11-86

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනිදායින් අවසන් වන කාලසීමාවට ජී. බී. ඇම්. දිසානායක මහතා බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබුහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වන දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

11-38

---

එල්.ඩී.—බී. 32/40

රා.ආ.වි./ලේ.—ඊ/පී 20/155 (67)

## අපරාධ නඩු විධාන සංග්‍රහය

### 2 වැනි වගන්තිය යටතේ නිවේදනය

මධ්‍යම පළාතේ පල්ලෙකැලේ, පල්ලෙකැලේ වතුයායේ පිහිටු වන ලද මූරපොල, පොලිස් ස්ථානයක් විය යුතු යයි (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශයට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 දින,
කොළඹ දී ය.

11-51

---

## සමගි මණ්ඩල පනත

### 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින් ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින් ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැන ගේ කාර්යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1970 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ඇදිගම ගම් ප්‍රදේශය ;
2. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි තෝලංගමුව ගම් ප්‍රදේශය ;
3. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි තුම්පනේ පත්තු උඩපළාත නැගෙනහිර ගම් ප්‍රදේශය ;
4. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි තුම්පනේ පත්තු පල්ලෙ පළාත ගම් ප්‍රදේශය ;
5. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි කල්පිටිය ගම් ප්‍රදේශය ;
6. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි මාරාවිල ගම් ප්‍රදේශය ;
7. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි වලහපිටිය ගම් ප්‍රදේශය ;
8. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි මහවැව ගම් ප්‍රදේශය.

11-67

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, බදුලු දිස්ත්‍රික්කයේ පට්ටිපොල ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සියළුම සාමාජිකයින් හා සභාපති ද එකී තනතුරු වලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-68/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සියළුම සාමාජිකයින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-68/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සියළුම සාමාජිකයින් හා සභාපති ද එකී තනතුරු වලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගෙ
පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-68/3

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම —

(අ) 1970 ජනවාරි 23 වැනි දින අංක 14,890 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 3 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ දන්කොටුව සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) දන්කොටුව පදිංචි තම්මහෙට්ටිමුදලිගේ මයිකල් පීරිස් මහතා.

(2) දන්කොටුව පදිංචි තම්මහෙට්ටිමුදලිගේ රෝගුස් පීරිස් මහතා.

(3) දන්කොටුව, සී. ජේ. මාවත පදිංචි කිරිහෙට්ටිගේ ඔගස්ටින් පීලික්ස් ප්‍රනාන්දු මහතා.

(4) දන්කොටුව පදිංචි දොන් වින්සන් ජයකොඩි මහතා.

(5) දන්කොටුව, මෝරුක්කුළිය පදිංචි වින්සන් ද පෝල් ප්‍රනාන්දු පුල්ලේ මහතා.

(6) දන්කොටුව, ගෝනවිල පදිංචි ස්වර්ණාධිපතිකුරුප්පුගේ මීගෙල් කුරේරා මහතා.

(7) දන්කොටුව, දුම්මලකොටුව පදිංචි වර්ණකුලසූරිය ජූසේ ප්‍රනාන්දු මහතා.

(8) දන්කොටුව, ගෝනවිල පදිංචි හෙට්ටිආරච්චිගේ පියුස් පෙරේරා මහතා.

(9) දන්කොටුව, පන්තල පාර අංක 40 හි පදිංචි කච්චකඩුගේ ගොඩ්ප්‍රි ජෝසප් ප්‍රනාන්දු මහතා.

(10) දන්කොටුව පදිංචි මතියස් ප්‍රනාන්දු හයපියල් පුල්ලේ මහතා.

(11) දන්කොටුව, " සුසිලාවිලා " හි මාක් ඇන්ටනි ප්‍රනාන්දු පුල්ලේ මහතා.

(12) දන්කොටුව, බෝලවත්ත පාර පදිංචි මහීපාල මුදලිගේ තෝමස් පාරිස් මහතා.

(13) දන්කොටුව, ගෝනවිල පදිංචි ජයකොඩි ආරච්චිගේ දොන් බෙන්ජමින් එම්මානුවෙල් මහතා.

(14) දන්කොටුව, පිටාගාර පදිංචි මදුරාවල ගමගේ දොන් පෝල් මහතා.

(15) දන්කොටුව, පන්තල පාර පදිංචි ජයසූරිය කුරණගේ මීගෙල් පෙරේරා මහතා.

(ආ) දන්කොටුව පදිංචි තම්මහෙට්ටිමුදලිගේ මයිකල් පීරිස් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-146/1

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම —

(අ) 1969 දෙසැම්බර් 26 වැනි දින අංක 14,886 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 5 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මිනිපේ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හඳගනාව පදිංචි අබේසෙක්ර මුදියන්සේලාගේ අප්පුහාමි අබේසේකර මහතා.

(2) මිණිපේ, මොරයාය පදිංචි යාපා මුදියන්සේලාගේ අබේරත්න මහතා.

(3) මිණිපේ, මොරයාය පදිංචි ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා.

(4) මිණිපේ, ගගේවත්ත පදිංචි වැවේ මුදියන්සේලාගේ විජේරත්න මහතා.

(5) මිණිපේ, මොරයාය පදිංචි මල්වත්ත මොහොට්ටිගේ ප්‍රන්සිස් මහතා.

(6) වේරගන්තොට, වේරගම පදිංචි අකුරුටිය ගමගේ බැප්ටිස් මහතා.

(7) හඳගනාව, 2 කණුව පදිංචි ජී. ජී. ධනපාල මහතා.

(8) මිණිපේ, අංක 32/3 හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ පල්ලේගෙදර පොඩිඅප්පුහාමි මහතා.

(9) අඹගහපැලැස්ස 12/25 හි පදිංචි කටුපුල්ලේ ගෙදර රන්බණ්ඩා මහතා.

(10) අඹගහපැලැස්ස 13/8 හි පදිංචි ජයසිරි මුදියන්සේලාගේ එගොඩ වෙලේගෙදර උක්කුබණ්ඩා මහතා.

(11) අඹගහපැලැස්ස පදිංචි යාපා මුදියන්සේලාගේ හේරත් ගෙදර හීන්බණ්ඩා මහතා.

(12) අඹගහපැලැස්ස 6/6 හි පදිංචි කුඹුරේගෙදර අප්පුහාමි මහතා.

(13) අඹගහපැලැස්ස ගන්දිවෙල, වඩනහලුගෙදර කුමරු මහතා.

(14) අඹගහපැලැස්ස, 5/1 හි පදිංචි යාපා මුදියන්සේලාගේ ධම්රත්න මහතා.

(15) අඹගහපැලැස්ස, 16/22 හි පදිංචි කොස්වත්ත මුහන්දිරම්ගේ මයිකල් මහතා.

(16) වේරගන්තොට, 46 ඇල පදිංචි බණ්ඩාරනායකගම් වලව්වේ විජේරත්න බණ්ඩා මහතා.

(17) වේරගන්තොට, දීග්ගොම්මන පදිංචි යාපා මුදියන්සේලාගේ විජේසිරි බණ්ඩාර මහතා.

(18) මිණිපේ මොරයාය පදිංචි යූ. එච්. එස්. සිල්වා මහතා.

(19) හඳගනාව පදිංචි එච්. ඇම්. පීටර් මහතා.

(ආ) හඳගනාව පදිංචි අබේසේකර මුදියන්සේලාගේ අප්පුහාමි අබේසේකර මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-146/2

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 සැප්තැම්බර් 26 වැනි දින අංක 14,873 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ

දැන්වීමේ උපලේඛනයෙහි අංක 4 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ පාතදුම්බර උඩගම්පහ දකුණ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) ගුන්නැපාන, අමුණුගම, අංක 118 හි පදිංචි ගලගොඩ වලව්වේ අබේරත්න බණ්ඩාර ගලගොඩ මහතා.

(2) කුණ්ඩසාලේ, මහවත්ත, "ප්‍රදීපය" හි පදිංචි යටවර රාජපක්ෂගේ සයිමන් ගුණසේන මහතා

(3) කුණ්ඩසාලේ, මහවත්ත, අංක 124 හි පදිංචි රන්කොත්ගේ දම්මසිරි ප්‍රේමචන්ද්‍ර මහතා.

(4) කුණ්ඩසාලේ, නත්තරම්පොත පදිංචි කිරිබණ්ඩා ජයසේකර මහතා.

(5) කුණ්ඩසාලේ, නත්තරම්පොත පදිංචි පිකිරි බණ්ඩා අත්තනායක මහතා.

(6) ගුන්නැපාන, සිරිමල්වත්ත පදිංචි සමරතුංග මුදියන්සේලාගේ පිකිරි බණ්ඩා මහතා.

(7) ගුන්නැපාන, පිලවල, අංක 37 හි පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ ගුණරත්න මහතා.

(8) ගුන්නැපාන, පිලවල, අංක 74/ඒ හි පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ කරුණාරත්න මහතා.

(9) කුණ්ඩසාලේ, පාතමුන පදිංචි ගම්බල ගෙදර විමලදාස මහතා.

(10) කුණ්ඩසාලේ, දම්බරාව පදිංචි හීන් බණ්ඩාර රත්නායක මහතා.

(11) කුණ්ඩසාලේ, පාතමුන පදිංචි උක්ගහ කුඹුරේ ගෙදර ජිනදාස මහතා.

(12) කුණ්ඩසාලේ, විදුරුගෙවත්ත පදිංචි මීගහගේ ඇල්බට් පෙරේරා මහතා.

(13) කුණ්ඩසාලේ, පොල්වත්ත පදිංචි හේරත් මුදියන්සේලාගේ ජයරත්න හේරත් මහතා.

(14) කුණ්ඩසාලේ, වරාපිටිය, "ආරිය" හි පදිංචි පිහිල්ල කම්කානම්ගේ ඇරියරත්න ද සිල්වා මහතා.

(15) කුණ්ඩසාලේ, මහවත්ත, "හේමසිරි මැදුර" හි පදිංචි ජිනවංශ රාජපක්ෂ මහතා.

(ආ) ගුන්නැපාන, අමුණුගම, අංක 118 හි පදිංචි ගලගොඩ වලව්වේ අබේරත්න බණ්ඩාර ගලගොඩ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11—146/3

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

චිත්‍රපටි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින්ව සිටි හෙන්රි ධර්මසේන, සරණගුප්ත අමරසිංහ හා ඒ. රත්නම් යන මහතුන් වෙනුවට නම නියම කොට පත්කළ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට බී. ඇම්. ඒ. බස්නායක, ආර්. ඒ. සිරිවර්ධන සහ එඩ්වින් ප්‍රනාන්දු යන මහතුන්.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දීය.

11—16

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් ලෙස 1970 අප්‍රේල් මස 25 වැනි දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ පෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දීය.

#### නම නියම කොට පත් කරන ලද සාමාජිකවරු

(1) ඩී. ආර්. සී. හත්වැල්ල මහතා
(2) පී. ඩී. අභයපාල මහතා
(3) නීතිඥ ඩී. එස්. රාජපක්ෂ මහතා

#### සේව්‍ය නියෝජිත සාමාජිකවරු

(1) ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා
(2) ට්. රාජසූරිය මහතා
(3) ඇල්. ඊ. විරසේකර මහතා
